සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 0830 - 1030

හින්දු ශිෂ්ටාචාරය I
இந்து நாகரிகம் I
Hindu Civilization I

46 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එහි අංකය** උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** පැරණිතම වේද ග්‍රන්ථය කුමක් ද?
(1) ප්‍රාමනංගල් (2) සංහිදෛහල් (3) ආරණියගංගල් (4) උපනිෂද් (5) වේදාංගංගල්

**2.** වරුණ ව්‍යුහ හතරෙහි ආරම්භය පිළිබඳ කියැවෙන ඍග්වේදයේ ගීතිකාව ඇතුළත් වී ඇති ග්‍රන්ථය කුමක් ද?
(1) මුනිසූක්තම් (2) වරුණ සූක්තම්
(3) නාසදීය සූක්තම් (4) බ්‍රම්මචාරිය සූක්තම්
(5) පුරුෂ සූක්තම්

**3.** ශෛව සිද්ධාන්ත මත හා සම්බන්ධ උපනිෂද් වන්නේ,
(1) බෘහදාරණ්‍යක උපනිෂද් (2) කඨෝපනිෂද්
(3) මුණ්ඩක උපනිෂද් (4) ස්වදාස්වධර උපනිෂද්
(5) සාන්දෝග්‍ය උපනිෂද්

**4.** ඍග් වේදයෙන් ප්‍රශංසා කරනු ලබන දෙවිවරුන්ගෙන් අහස හා සම්බන්ධ දෙවිවරුන්ගේ නම් ඇතුළත් කාණ්ඩය
(1) මිත්තිරන්, බෘහස්පති, සරස්වති (2) වරුණන්, ආදිත්‍යන්, විශ්ණු
(3) බෘහස්පති, අග්නි, මිත්තිරන් (4) ඉන්ද්‍රන්, රුද්‍රන්, සෝමන්
(5) වායු, පර්ජන්‍යන්, බෘහස්පති

**5.** ඍග් වේදයේ ගීතිකා හා සම්බන්ධ ඍෂිවරුන් තිදෙනකුගේ නම් ඇතුළත් කාණ්ඩය
(1) අත්තිරි, වසිට්ටර්, ව්‍යාසර් (2) වාමදේවර්, අත්තිරි, සෝමසම්බු
(3) කෘත්සමදර්, වාල්මීකි, වාමදේවර් (4) විසුවාමිත්තිරර්, වාමදේවර්, පරත්තුවාසර්
(5) කෘත්සමදර්, උක්කිරසේනර්, වාත්‍යායනර්

**6.** 'වෛදික මාර්ගය' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) පුරාණංගල් විසින් ප්‍රශංසා කරන දේව මාර්ගයයි.
(2) උපනිෂද් පැහැදිලි කරන දාර්ශනික මාර්ගයයි.
(3) බ්‍රහ්ම සූත්‍රම් පැහැදිලි කරන ජීවන මාර්ගයයි.
(4) වේද ග්‍රන්ථ මූල්කරගත් ආගමික මාර්ගයයි.
(5) ඉදිහාසංගල් මූලික කරගත් ජීවන මාර්ගයයි.

**7.** ඉන්දු ගංගාව ගලා බසින ප්‍රදේශය භූවිද්‍යා පර්යේෂකයින්ගේ පරීක්ෂණයට ලක් වූ කාලපරිච්ඡේදය කුමක් ද?
(1) 1850 - 1900 (2) 1900 - 1920 (3) 1910 - 1925 (4) 1922 - 1930 (5) 1930 - 1950

**8.** ඉන්දු - නිම්න ශිෂ්ටාචාර නගරවලින් එකක් වන හරප්පා වර්තමානයේ පිහිටා ඇත්තේ කොහේ ද?
(1) ඔරිසා ප්‍රාන්තයේ ය. (2) බස්නාහිර පන්ජාබ් ප්‍රාන්තයේ ය.
(3) හරියානා ප්‍රාන්තයේ ය. (4) මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ ය.
(5) ආන්ද්‍රා ප්‍රාන්තයේ ය.

**9.** විමුක්ති තත්ත්වයේ වැදගත් කොටස් හතර ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) කර්මම්, භක්ති, යෝගම් හා ඥානම්
(2) සරියෛ, කිරියෛ, යෝගම් හා ඥානම්
(3) කල්පම්, සිට්සෛ, නිරුත්තම් හා ව්‍යාකරණම්
(4) සාලෝගම්, සාමීබම්, සාරූබම් හා සායුච්චියම්
(5) කර්ශනම්, ප්‍රදීශ්ශයි, උට්සවම් හා ප්‍රායච්චිත්තම්

**10.** 'ඉන්දු සමය කලෛකලත්ජියම්' යනුවෙන් ප්‍රශංසා කරනු ලබන්නේ,
(1) වේද ය. (2) ආගමංගල් ය. (3) ඉදිහාසංගල් ය. (4) උපනිෂද් ය. (5) ස්මිරුදිහල් ය.

**11.** පුරාණංගල් 'තෙන්නාට්ටු කරුවූලම්' යනුවෙන් ප්‍රශංසා කරනු ලැබීමට හේතුව කුමක් ද?
(1) දේවාල, නර්ථනය, මූර්ති කලාව සහ සිතුවම් කලාව සඳහා ඇති කළ බලපෑම
(2) යාග පිළිවෙත්වලට ඇති කළ බලපෑම
(3) තාරකා ශාස්ත්‍රවලට ඇති කළ බලපෑම
(4) සංගීත කලාවට ඇති කළ බලපෑම
(5) ගංගා ප්‍රශංසා කිරීම

**12.** "මයොන් මේය කාඩුරෛ උලගමුම්....." යන පේළි මගින් තිරුමාල් දෙවියන් පිළිබඳ වර්ණනා කරන සංඝ යුගයේ සාහිත්‍ය කෘතිය කුමක් ද?
(1) අගනානූරු (2) පරිපාඩල්
(3) තිරුමුරුගාට්‍රුප්පඩෛ (4) තොල්කාප්පියම්
(5) පදිට්‍රුප්පත්තු

**13.** තිරුමුරුගාට්‍රුප්පඩෛ යන සාහිත්‍ය කෘතියේ කතුවරයා කවුරුන් ද?
(1) කබිලර් (2) පරණර් (3) තොල්කාප්පියර් (4) පරත්තුවාසර් (5) නක්කීරර්

**14.** පහත සඳහන් ඒවායින් කාරෛක්කාල් අම්මෙයාර්ගේ භක්තිය පිළිබිඹු කරන ගීතිකාව කුමක් ද?
(1) "ඒළිසෛයායි ඉසෛප්පයනායි..."
(2) "කාදලාගික් කසින්දු කන්නීර් මල්ගී..."
(3) "පන්නුම් පදමේලුම් පලවෝසෛත් තමිලවයුම්..."
(4) "කුණිත්ත පුරුවමුම් කෝව්වෛච් චෙව්වායිට් කුමින් සිරිප්පුම්..."
(5) "පිරවාමෛ වේන්ඩුම් පිරප්පුන්ඩේල් නින් තිරුවඩි මරවාමෛ වේන්ඩුම්..."

**15.** ශෛව ආගමික සේවාවල ප්‍රකට වී සිටි මහේන්ද්‍ර වර්මන් පිළිබඳ සඳහන් සෙල් ලිපිය කුමක් ද?
(1) තිරුච්චි මන්නච්ච නල්ලූර් සෙල් ලිපිය
(2) තිරුච්චිරාප්පල්ලි ගුහා දේවාල සෙල් ලිපිය
(3) කාංජීපුරම් උත්තර මේරූර් සෙල් ලිපිය
(4) නාගෛයූර් සෙල් ලිපිය
(5) සෙංගල්පට්ටු දිස්ත්‍රික්කයේ තිරුමුක්කූඩල් සෙල් ලිපිය

**16.** අහිමි වූ තම දෘෂ්ඨිකත්වය ශිව දෙවියන්ගේ ආශිර්වාදයෙන් නැවත ලබා ගත් නායනාර් තුමා,
(1) තිරුඥාන සම්බන්තර් ය. (2) සුන්දරමූර්ති නායනාර් ය.
(3) තිරුනාවුක්කරසර් ය. (4) ඉලයාන්කුඩි මාරනාර් ය.
(5) මානික්කවාසගර් ය.

**17.** කොඩික්කවි යනු,
(1) වෙන්පාක්කල් හතරකින් යුක්ත එකකි.
(2) තිරුවිරුත්තංගල් හයකින් යුක්ත එකකි.
(3) වෙන්පාක්කල් දහතුනකින් යුක්ත එකකි.
(4) වෙන්පාක්කල් පනස්තුනකින් යුක්ත එකකි.
(5) විරුත්තප්පාක්කල් සියයකින් යුක්ත එකකි.

More Past Papers at
tamilguru.lk

**18.** 'ශෛව සිද්ධාන්ත මාර්ගයේ සිටින්නා' (ශෛව සිද්ධාන්ත මාර්ක්කඃ) යනුවෙන් සෙල් ලිපියක සඳහන්ව ඇති පල්ලව රජතුමා කවුරුන් ද?
(1) ස්කන්ධ වර්මන් (2) සිම්මවිෂ්ණු
(3) මහේන්ද්‍ර වර්මන් (4) නන්දි වර්මන්
(5) රාජසිම්මන්

[තුන්වැනි පිටුව බලන්න.

**19.** ගරුඩපුරාණම් විශේෂයෙන් සඳහන් කරන්නේ කුමක් පිළිබඳව ද?
(1) සූරන්පෝර් මගින් අහංකාරකම තුරන් කිරීම
(2) පාපකර්ම සහ ප්‍රායච්චිත්තම්
(3) යමසංගාරම් මගින් භක්තියේ සුවිශේෂී භාවය
(4) දේවාලය සහ තීර්තම්
(5) දෙවියන් පිළිබඳ ඓතිහාසික කථා

**20.** සංඝ යුගයේ මිනිසුන් අතර ප්‍රචලිතව තිබූ 'නඩුකල්' මගින් සංකේතවත් කරනු ලබන්නේ,
(1) සතිපූජා කළ කාන්තාවන් ය. (2) වැව් ඉදි කළ සමාජ සේවකයන් ය.
(3) යුද්ධයේ දී දිවි පිදූ සොල්දාදුවන් ය. (4) දේවාල ඉදි කළ පුද්ගලයන් ය.
(5) ධර්මශාලා ඉදි කළ අය ය.

**21.** සාමාන්‍ය මහජනතාව අතර පැවති මන්ත්‍ර පිළිබඳ විශ්වාසවලට වැඩි දායකත්වයක් ලබා දුන් ග්‍රන්ථය කුමක් ද?
(1) මනුස්මිරුදි (2) රාමායනය (3) සාගුන්තලම් (4) ඍග් වේදය (5) අථර්ව වේදය

**22.** ආර්ය චක්‍රවර්තීන් යුගයේ බිහිවූ ජ්‍යොතිශ්‍ය ග්‍රන්ථය
(1) සෙගරාසසේකරම් (2) කදිරෛමලෛපල්ලු
(3) කෛලායමාලෛ (4) සරසෝදිමාලෛ
(5) පරරාසසේකරම්

**23.** අනන්ත සයන හැඩය තුළින් සංකේතවත් කරන්නේ කුමක් ද?
(1) දෙවියන් කාල තුන පිළිබඳව අවබෝධයෙන් සැතපී සිටින ආකාරය
(2) අය්‍යප්පන් දෙවියන් ආශිර්වාද කරන ආකාරය
(3) ශිව දෙවියන් හා පත්තිනි දෙවියන් එකට සිටින ආකාරය
(4) ආල්වාර්ලාගේ වන්දනා කිරීමේ ආකාරය
(5) ශිව දෙවියන්ගේ නර්තන විලාශය

**24.** "එන්කඩන් පනි සේයිදු කිඩප්පදෙ" යන සංකල්පය ප්‍රායෝගික ජීවිතයේ දී යථාර්තයක් කළ පුද්ගලයා කවු ද?
(1) තිරුඥාන සම්බන්තර් (2) තිරුනාවුක්කරසර්
(3) සුන්දරමූර්ති නායනාර් (4) මානික්ක වාසගර්
(5) සේක්කිලාර්

**25.** 'විඥාන කලර්' යන්නෙන් හඳුන්වන්නේ කවුරුන් ද?
(1) අහංකාර මලම් පමණක් ඇති අය
(2) කන්ම මලම් පමණක් ඇති අය
(3) අහංකාරය සහ කන්මම් යන මලම් දෙවර්ගයම ඇති අය
(4) අහංකාරය සහ මායෛ යන දෙවර්ගයම ඇති අය
(5) අහංකාරය, කන්මම් සහ මායෛ යන මලම් වර්ග තුනම ඇති අය.

**26.** තෛත්‍රිය උපනිෂද්වල ගුරුකුල අධ්‍යයනය අවසන් කර නිවසට පැමිණෙන ශිෂ්‍යයාට ඇඳුරු තුමා ලබා දෙන උපදෙස් මොනවා ද?
(1) "අඳුරේ සිට එළිය කරා මාව ගෙන යනු මැන."
(2) "ඔබ එය වේ. සියලු දේ වශයෙන් පවතින්නේ බ්‍රහ්මයයි."
(3) "අසත්‍යයේ සිට සත්‍ය කරා මාව ගෙන යනු මැනවි."
(4) "සත්‍ය කථා කරන්න. ධර්මය පිළිපදින්න."
(5) "සියලු දෙනා සමගින් ආදරෙන් සිටින්න. සොමිගුණෙන් කථා කරන්න."

**27.** හින්දු ආගම උගන්වන ධර්මයේ ප්‍රධානතම අරමුණ වන්නේ කුමක් ද?
(1) මිනිස් කුලය ආධ්‍යාත්මිකව පූර්ණත්වය හා සතුට ලබාගැනීමට මගපෙන්වීම
(2) භක්ති මාර්ගයට මගපෙන්වීම
(3) මිතුරන් හොඳ මග කරා ගෙන ඒම
(4) අසල්වැසියන් සමගින් එකමුතුව ජීවත් වීම
(5) ප්‍රිය වචන කථා කිරීම

**28.** "ලොව ශිෂ්ටාචාරවලට ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ දායකත්වය අතිමහත් ය" යනුවෙන් සඳහන් කිරීමට හේතුව කුමක් ද?
(1) පුරාණ කාලයේ සිට අසල්වැසි රටවල් සමග ඇති වූ සම්බන්ධතා
(2) ආගමික වන්දනා ක්‍රමවල පැතිරීම, කලාවන් සහ ධර්ම ශාස්ත්‍රවල බලපෑම
(3) ලෞකිකත්වයට ලබා දෙනු ලබන වැදගත්කම
(4) මහා කාව්‍ය ඇතුළත්ව තිබීම
(5) විද්වතුන්ගේ දායකත්වය

**29.** දේවාල ගෘහ නිර්මාණ ශිල්පයේ 'අධිෂ්ටානම්' යනුවෙන් සඳහන් කරනු ලබන්නේ දේවාලයේ කුමන කොටස ද?
(1) දේවාල ගොඩනැගිල්ලේ උපපීඨයට ඉහළ කොටස ය.
(2) දේවාලයේ ප්‍රධාන කුටියට ඉහළ කොටස ය.
(3) දේවාල ගොඩනැගිල්ලේ පිහිටා තිබෙන තිරුවාසි ය.
(4) දේවාලයේ කුලුනු පිහිටා තිබෙන කොටස ය.
(5) දේවාලය මැද කොටස ය.

**30.** පහත සඳහන් ඒවායින් රාමානුජර් හා සම්බන්ධ ප්‍රකාශය කුමක් ද?
(1) සත්‍ය දේ බ්‍රම්මම් යන්න පමණි යනුවෙන් පැහැදිලි කළ අයෙකි.
(2) බ්‍රම්මම් ආත්ම බවට පත් කරන්නේ අවිත්තෙ වේ යැයි පැහැදිලි කළ අයෙකි.
(3) වේද වර්ග පහ පිළිබඳව පැහැදිලි කළ අයෙකි.
(4) ලෝකය යනු දර්ශනයක් පමණි යනුවෙන් සඳහන් කළ අයෙකි.
(5) අංග අංගි භාවය පිළිබඳව පැහැදිලි කළ අයෙකි.

**31.** ශෛව ආගමික සම්ප්‍රදායේ තෝත්‍රයක් හා ශාස්ත්‍රයක් වශයෙන් පවතින ග්‍රන්ථය කුමක් ද?
(1) ශිවඥානපෝදම් (2) තිරුමන්දිරම් (3) තිරුවරුට්පයන්
(4) කන්දපුරාණම් (5) ශිවප්‍රකාසම්

**32.** 'කුඩෛතලි' යනු කුමක් ද?
(1) දේවාලයේ ප්‍රධාන කුටියේ දේව ප්‍රතිමාව හා එකට තිබෙන්නකි.
(2) පල්ලව යුගයේ දේවාල ගෘහ නිර්මාණ වර්ධනයේ මුල්ම අඩියර වශයෙන් පවතින්නකි.
(3) දේවාලයේ ගෝපුරය හා එකට තිබෙන්නකි.
(4) පර්වතයට ඉහළ සිට පහළට නෙළා ඉදිකරනු ලබන දේවාල වේ.
(5) කුඩා පිළිම ගෙවල්වලින් (දේව කෝට්ටම්) යුතු දේවාල වේ.

**33.** "කුඩා නා ඇටයේ සිට විශාල නා ගස බිහිවන්නා සේ කුඩාම බ්‍රහ්මයේ සිට මෙම ලොව බිහිකරනු ලැබුවේ ය." යනුවෙන් සඳහන් කරනු ලබන උපනිෂද් වනුයේ,
(1) මුණ්ඩක උපනිෂද් ය. (2) මාණ්ඩූක්‍ය උපනිෂද් ය.
(3) කේන උපනිෂද් ය. (4) සාන්දෝක්‍ය උපනිෂද් ය.
(5) බෘහදාරණ්යක උපනිෂද් ය.

**34.** උපනිෂද්වලින් පැහැදිලි කරනු ලබන බ්‍රහ්මය ලොවට එහා ගිය තත්ත්වයන් පැහැදිලි කිරීම
(1) නිශ්ප්‍රබන්ජ තත්ත්වය වේ. (2) නිර්ගුණ බ්‍රහ්ම තත්ත්වය වේ.
(3) ශගුණ බ්‍රහ්ම තත්ත්වය වේ. (4) තඩත්ත තත්ත්වය වේ.
(5) පේදාපේද තත්ත්වය වේ.

**35.** "භක්ති සුවෛ නනි සොට්ටච් සොට්ට පාඩිය කවිවලව" යනුවෙන් ප්‍රශංසා කරනු ලැබුයේ
(1) අප්පර් ය. (2) සුන්දරර් ය.
(3) සේක්කිලාර් ය. (4) සේරමාන් පෙරුමාල් ය.
(5) කාරෙක්කාල් අම්මෙයාර් ය.

**36.** තිරුමූලර් විසින් 'නාඩමාඩුම් කෝයිල්' යනුවෙන් බුහුමන් ලැබූ අය කවුරුන් ද?
(1) පූජකවරුන් (2) ශිව භක්තිකයින් (3) කවියන්
(4) ආල්වාර්ලා (5) කැටයම් ශිල්පීන්

**37.** ශෛව සිද්ධාන්තයේ ආත්මීය විමුක්තියට අදාළ පරිනත බව ලබන අවස්ථාවේ දේව බලයක් වශයෙන් ලැබෙන්නේ,
(1) තිරෝධානම් වේ. (2) කර්මම් වේ. (3) මායෙ වේ.
(4) භක්ති වේ. (5) ඥානම් වේ.

**38.** "කලාවන් බිහිකිරීම පිරිසිදු හදවතින් කරනු ලබන කාර්යයකි" යනුවෙන් සඳහන් කළ සහ හින්දු කලාව ලොවපුරා ගෞරවාදරයට පාත්‍ර කළ ශ්‍රී ලාංකිකයා කවුද?
(1) ස්වාමි විපුලානන්දර් (2) සර් පොන්නම්බලම් රාමනාදන්
(3) කලායෝගී අනන්ද කුමාරස්වාමි (4) ස්වාමි ඥානප්‍රකාශර්
(5) සර් කන්දයියා වෛද්‍යනාදන්

**39.** "මුන්දෛ විනෛ මුලුදුම් ඕය උරෛප්පන් යාන්..." යන ගී ඛණ්ඩය සඳහන් වන ග්‍රන්ථය කුමක් ද?
(1) තිරුවාසග ශිවපුරාණම් (2) පෙරිය පුරාණම්
(3) භාර්කව පුරාණම් (4) කන්ද පුරාණම්
(5) තිරුමුරෛකණ්ඩ පුරාණම්

**40.** ශෛව දේවාලවල නිත්‍ය පූජාවේ සිදු වන පොදු කරුණු තුනක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
(1) දීපාරාදනෛ, අර්චනෛ සහ ප්‍රදෝශම්
(2) අභිෂේගම්, අලංගාරම් සහ නෛවෙත්තියම්
(3) තොත්තිරම්, නිරුත්තියම් සහ කලස පූජාව
(4) පූදසුත්ති, ජෙබම් සහ කාර්තිගෛ පූජාව
(5) නෛවේත්තියම්, කුම්බ පූජාව සහ සඳුර්ත්ති පූජාව

More Past Papers at
tamilguru.lk

● අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශ කියවා, එයට සුදුසු ඒවා පහත වගුවේ සඳහන් **I, II, III, IV** යන තීරුවලින් තෝරන්න.

| I | II | III | IV |
|---|---|---|---|
| A<br>පාසම් | F<br>දක්ෂිණාමූර්ති | K<br>මානසාරම් | P<br>අංගුසම් |
| B<br>මරෛ | G<br>මෝදහ හස්තම් | L<br>සුයම්බු | Q<br>මයමදම් |
| C<br>චන්ද්‍රසේකරර් | H<br>දේවාල කළ සේවා වර්ධනය වීම | M<br>දේවාල ආශ්‍රිතව මඩංගල් පිහිටීම | R<br>එලුදාකිලච් |
| D<br>ආඩල්වල්ලාන් ආගමික සංකේතය | I<br>අබෙලරුෂේයම් | N<br>තිරිපුරාන්දකර් | S<br>පිළිම කලාව වර්ධනය වීම |
| E<br>විශ්ණු ධර්මෝත්තිරම් | J<br>සිට්පච් සෙන්නුල් | O<br>උදරබන්දම් | T<br>ලිංගම් |

**41.** වේද හඳුන්වන වෙනත් නම් සඳහන් කාණ්ඩය කුමක් ද?
(1) A, G, L, P (2) B, F, M, T (3) B, I, L, R (4) C, F, M, T (5) E, I, O, R

**42.** ගණදෙවියන්ගේ ස්වරූපය හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) A, F, K, R (2) A, G, O, P (3) B, H, K, S (4) D, I, O, R (5) E, J, N, R

**43.** ශිව දෙවියන්ගේ ස්වරූප සඳහන් වන කාණ්ඩය කුමක් ද?
(1) A, F, M, T (2) B, G, K, S (3) C, F, N, T (4) D, J, O, R (5) E, H, L, R

**44.** චෝල අධිරාජ්‍යයේ අභිමානය සඳහන් වන කාණ්ඩය කුමක් ද?
(1) A, J, O, R (2) B, F, M, T (3) C, F, N, T (4) D, H, M, S (5) E, H, L, R

**45.** හින්දු කලා සම්ප්‍රදායට අදාළ ශිල්පකලා ග්‍රන්ථ ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) A, G, K, P (2) C, F, M, T (3) D, G, N, T (4) E, J, K, Q (5) E, F, M, Q

- අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව කිසියම් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දී ඇත. ඒවායින් මාතෘකාව හා **නොගැළපෙන** කරුණ තෝරන්න.

**46. පල්ලව යුගය හින්දු සංස්කෘතියට ඇති කළ බලපෑම**

(1) දේවාල වර්ධනය වීමත් සමග ම දේවාල පූජා සම්ප්‍රදායේ ද වර්ධනයක් ඇති විය.
(2) මාමල්ලපුරම්හි පිහිටි තනි පර්වත දේවලවල පත්තිනි දෙවියන්ට අදාළ ව අර්ජුන රථ හා ධර්මරාජ රථ ඉදිකරනු ලැබුවේ ය.
(3) මහේන්ද්‍රවර්මන්ගේ පාලන සමයේ හින්දු සංස්කෘතික පුනරුදය සහ ආගමික මාර්ගයේ හැරවුම් ද ඇති විය.
(4) පල්ලවයන්ගේ නන්දි ලාංඡනය සහ ශිව දෙවියන්ගේ කට්ටුවාංග කොඩිය පල්ලවයන් ශෛව ආගම කෙරෙහි දරාසිටි උනන්දුව පිළිබිඹු කරයි.
(5) මහේන්ද්‍රවර්මන් පස් සහ දැවවලින් තොරව නව පර්වත දේවාල ඉදි කළේ ය.

**47. ස්වාමි විවේකානන්දර්**

(1) ආසන්න වශයෙන් වසර පනහක් සේවාවේ යෙදී සිට හින්දු සංස්කෘතිය වර්ධනය කළේ ය.
(2) දහනවවන සියවසේ විසූ හින්දු ආගමික පුනරුදය ඇති කළ අය අතුරෙන් පුරෝගාමීව කටයුතු කළ අයෙකි.
(3) චිකාගෝ නුවර පැවති සර්වාගමික සමුළුවේ ලෝක ප්‍රසිද්ධ දේශනය පැවැත්වූවෙකි.
(4) හින්දු ආගමට සිදු කළ සේවාව වෙනුවෙන් වේදාන්ත සිංගම්, වීරත්තුරවි යන ගෞරව නාමවලින් හඳුන්වනු ලැබූ අයෙකි.
(5) තම ඇදුරුතුමාගේ නාමයෙන් රාමක්‍රිෂ්ණ මඩම ස්ථාපනය කර ආධ්‍යාත්මික ඉලක්කයක් සහිතව සේවය කළ අයෙකි.

**48. මහාචාර්ය කා. කෛලාසනාථ කුරුක්කල්තුමා**

(1) තිරුනෙල්වේලි පරමේෂ්වරා විදුහලේ ආදි ශිෂ්‍යයෙකි.
(2) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තම ආචාර්ය උපාධි පර්යේෂණය සිදු කරනු ලැබුවේ ය.
(3) නල්ලූර්හි උපත ලැබූ මොහු හින්දු ශිෂ්ටාචාරයට අභිමානයක් ඇති කළ විද්වතෙකි.
(4) ආධ්‍යාත්මික අධ්‍යාපනය තම පියාණන්ගෙන් ද ,වෛදික අධ්‍යාපනය බ්‍රහ්මශ්‍රී ක. සිදම්බර ශාස්ත්‍රිහල් සහ බ්‍රහ්මශ්‍රී සීතාරාම ශාස්ත්‍රිහල් යන අයගෙන් ද ලබා ගත්තේ ය.
(5) යාපනය විශ්වවිද්‍යාලයේ හින්දු ශිෂ්ටාචාර පීඨයේ පළමු මහාචාර්යවරයා ලෙස ද එහි පීඨාධිපති තුමා ලෙස ද සේවය කර විශ්වවිද්‍යාල මට්ටමේ එම පාඨමාලාවේ වර්ධනය සඳහා ඇප කැප වූ කෙනෙකි.

**49. ශ්‍රී ලංකාවේ හින්දු ආගමික වර්ධනයට මාධ්‍යවල දායකත්වය**

(1) පුවත්පත් මගින් ආගම සම්බන්ධ කරුණු ප්‍රකාශයට පත් කරනු ලබයි.
(2) අනුමානය, උපකල්පනය යන ඒවා ද මාධ්‍ය ප්‍රකාශනවල දක්නට ඇත.
(3) මිනිසාට පුළුල් ආගමික දැනුමක් ලබා ගැනීමට මාධ්‍ය උපකාරී වේ.
(4) මහජනයාගේ යහපැවැත්මට අවශ්‍ය වන තොරතුරු විශාල ප්‍රමාණයක් ලබා දෙයි.
(5) ශ්‍රී ලංකාව තුළ හින්දු ආගමික සංස්කෘතියේ වර්ධනයට දීර්ඝ කාලයක් තිස්සේ මාධ්‍ය පුළුල් මෙහෙයක් ඉටු කර ඇත.

**50. සිවාගමංගල් මගින් වර්ධනය කරනු ලැබූ දේවාල සංස්කෘතිය**

(1) සිවාගමංගල් සංඛ්‍යාවෙන් දහඅටක් වේ.
(2) සිවාගමංගල් දේවාල නිර්මාණ ක්‍රම පිළිබඳව සඳහන් කරයි.
(3) දේවාල සංස්කෘතිය වර්ධනය කිරීමෙහිලා සිවාගමංගල් මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියා කරනු ලබයි.
(4) සිවාගමංගල් සරියෛ, කිරියෛ, යෝගම් සහ ඥානම් යන මාර්ග හතර පිළිබඳව පැහැදිලි කරයි.
(5) කිරියාපාදම් දේවාල නිර්මාණය, ස්ථාපිත කිරීම සහ උත්සවම් යන පිළිවෙත් පිළිබඳව දක්වයි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

46 S II

2019.08.06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

※ **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

**1.** දෙවියන් පිළිබඳව ශෛව සිද්ධාන්තම්හි සඳහන් කරුණු පිළිබඳව පහත මාතෘකා ඇසුරින් පරීක්ෂා කරන්න.
(අ) දෙවියන් පිළිබඳ සත්‍ය
(ආ) දෙවියන්ගේ ලක්ෂණ
(ඉ) ආත්මය සහ දෙවියන්
(ඊ) ආධ්‍යාත්මික නිදහස සහ දේව ආශිර්වාදය

**2.** ශ්‍රී ලාංකේය හින්දු ආගමික ඉතිහාසයේ අනුරාධපුර යුගයට ලැබෙන වැදගත්කම පහත සඳහන් මාතෘකාවලින් සාකච්ඡා කරන්න.
(අ) දේවාල
(ආ) පැවැති කාල පරිච්ඡේදය
(ඉ) සනාථ කිරීමට අදාළ සාක්ෂි
(ඊ) රජවරුන්ගේ සේවා

**3.** හින්දු ශිෂ්ටාචාර ඉතිහාසයේ සමාජ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරවල සහ භක්තිනෙරියාලර්ලාගෙන් ලැබුණු දායකත්වය ප්‍රසංශා කළ යුත්තකි.
(අ) සාමාජ ප්‍රතිසංස්කරණ ව්‍යාපාර බිහිවීමට හේතු වූ කරුණු දක්වන්න.
(ආ) භක්ති ව්‍යාපාරයේ නායන්මාර්ලාගේ දායකත්වය සඳහන් කරන්න.
(ඉ) හින්දු ශිෂ්ටාචාරයේ වර්ධනයට කබීර්දාසර් **හෝ** තුලසිදාසර්ගෙන් ලැබුණු දායකත්වය පිළිබඳ ව කෙටියෙන් විස්තර කරන්න.
(ඊ) උතුරු ඉන්දීය භක්ති ව්‍යාපාරය හා පල්ලව යුගයේ භක්ති ව්‍යාපාරය අතර දක්නට ලැබෙන සමානකම් කෙටියෙන් පහදන්න.

## II කොටස

**4.** හින්දු සංස්කෘතියේ දේවාල පාදක කරගෙන පහත සඳහන් කලාවන් වර්ධනය වූ අයුරු පහදන්න.
(අ) සංගීත කලාව
(ආ) ගෘහ නිර්මාණ ශිල්පය

**5.** හින්දු භක්තිකයන්ගේ ආගමික හා සංස්කෘතික ජීවිත වර්ධනය කිරීමෙහිලා භගවත්ගීතාවට හිමිවන වැදගත්කම පහත සඳහන් මාතෘකා ඇසුරෙන් පරීක්ෂා කරන්න.
(අ) භගවත් ගීතාවේ නිර්මාණය
(ආ) භගවත් ගීතාවේ විශේෂතා

[දෙවැනි පිටුව බලන්න.

**6.** වේදාන්තයේ දාර්ශනික වර්ධනයේ මත්තුවර්ගේ තුවෛද වේදාන්තයේ මූලික සිද්ධාන්ත පහත සඳහන් කරුණු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(අ) බිහිවීමට හේතු වූ පසුබිම

(ආ) තුවෛද සිද්ධාන්තයේ වැදගත්කම

**7.** විජය නගර නායක්කර් යුගයේ හින්දු සංස්කෘතියේ ඇතිවූ වෙනස්කම් පහත සඳහන් කරුණු ආශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

(අ) කාල පරිච්ඡේදය

(ආ) ආගමට හිමිවූ තත්ත්වය

**8.** හින්දු විද්‍යාව වර්ධනයෙහිලා තාරකා ශාස්ත්‍රයෙහි විශේෂතා පහත සඳහන් මාතෘකා ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

(අ) තාරකා ශාස්ත්‍ර සිද්ධාන්ත

(ආ) අතීත කාලයේ ඉන්දියානුවන්ගේ තාරකා ශාස්ත්‍රයට අදාළ සේවා

***

More Past Papers at
tamilguru.lk